**මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------**

මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 03 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතුරු ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වර්තමානයේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය ලෙස හඳුන්වනු ලබන ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාළිගාකන්දේ නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් හා නව ජලාශයක් ඉදිකිරීම, එලිහවුස් හි ජලාශයක් ඉදිකිරීම, කොට්ටාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශවල ජල සැපයුම පුළුල් කිරීම සහ කොළඹ තෝරාගත් වතු නිවාස සඳහා ජල සම්බන්ධතා ලබා දීම මඟින් කොළඹ නගරයේ හා කොට්ටාවත්ත - මුල්ලේරියාව ප්‍රදේශවල ජල සම්පාදනය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 4,785 කට සමාන ජපන් යෙන් මිලියන 5,359 ක් වූ අතර ඉන් රු.මිලියන 3,549 කට සමාන ජපන් යෙන් මිලියන 3,975 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි ශේෂ වටිනාකම වන රු.මිලියන 1,236 කට සමාන ජපන් යෙන් මිලියන 1,384 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 නොවැම්බර් 27 දින ආරම්භ කරන ලද අතර 2012 ජනවාරි වන විට නිම කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලය 2017 ජූනි 20 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපාතියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය රු.මිලියන 4,152 කට සමාන ජපන් යෙන් මිලියන 3,138 ක් විය. කෙසේ වුවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, ව්‍යාපෘතියට අදාල උපයෝජනය වෙන් වශයෙන් හඳුනා ගත නොහැකි වූ අතර ප්‍රදානකරු අරමුදල් සපයන ලද වෙනත් ව්‍යාපෘති 03ක උපයෝජනය ද ඇතුලත්ව එදිනට සමස්ථ උපයෝජනය ජපන් යෙන් මිලියන 13,231 ලෙස දක්වා තිබුණි. | නොසැසඳු ශේෂ | ණය අංක එස්.එල්.පී. 90 යටතේ මුළු වෙන් කිරීම් වූ ජපන් යෙන් මිලියන 13,231 ක අතරින් ජපන් යෙන් මිලියන 3,975 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් ජපන් යෙන් මිලියන 3,138 ක් වැය කර තිබූ අතර ඉතිරිය සෙසු ව්‍යාපෘති 03 විසින් උපයෝජනය කර තිබුණි. | ශේෂ සැසඳුම් කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

| විස්තරය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | | |
| මාලිගාකන්ද කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම | 2011 මැයි 31 | 2015 වර්ෂයේ කාර්යය සම්පූර්ණ කරන ලදී. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් අතිරේක ගොඩනැගිල්ල ක් පිරිවැය රු.මිලියන 18කට ඉදි කර තිබුණි. | ව්‍යාපෘති පිරිවැය අනවශ්‍ය ලෙස ඉහළ යනු ඇත. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් කර ඇති විෂය පථයේ කාර්යය සඳහා අනුගත වී ඒ අනුව අර මුදල් උපයෝජනයට ගත යුතුය. |
| කොටිකාවත්ත - මුල්ලේරියාව ජල සැපයුම් වර්ධනය<br>- අඹතලේ | | සිදු කර නැත. | ව්‍යාපෘතියේ අරමුණ | එම | උනන්දුව දක්වන පාර්ශවයන්ට |

| | | | |
|---|---|---|---|
| පොම්පාගාරයක් ඉදි කිරීම | ලබා කර ගත නොහැක. | | පහසුකම් සැලසීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරි සැලැස්මේ සැලසුම් කර ඇති කාර්යය සඳහා යොමු විය යුතුය. |
| - ගොතටුව භූගත ජලාශයක් හා පොම්පාගාරයක් ඉදි කිරීම | | | |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ කාර්ය නිම කිරීමේ ප්‍රමාදය මත 2017 ජුනි 20 දින දක්වා දෙවරක් ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබූ බව නිරීක්ෂණය විය. තවද , 2015 ජුනි 20 දින ණය අවසන් වීම මත ඉතිරි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වියදම් වෙනුවෙන් එකතුව රු.මිලියන 345.59 ක් කොන්ත්‍රාත්කරුගේ පෞද්ගලික බැංකු ගිණුමට මාරුකර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරු විසින් ආරම්භක අදියරේදී තීරණය කරන ලද ව්‍යාපෘති විෂය පථයේ ඇතුලත් කාර්යය නොසලකා ඉදිකිරීම් කාර්යය සිදු කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් මාසික බැංකු ප්‍රකාශන සමඟ ව්‍යාපෘතියට සැපයිය යුතු ගෙවීම් පිළිබඳ වාර්තා සපයා නොතිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් කාර්යය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයකි. | එස්.එල්.පී 90 ණය ගිවිසුම . 2015 ජුනි 20 දින අවලංගු වීම මත ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු සමඟ ඉතිරි වැඩ සඳහා පෙර කොන්ත්‍රාත්තුව සංශෝධනය කර ගිවිසුම් අත්සන් කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් එම කොන්ත්‍රාත්තුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා රේඛීය අමාත්‍යාංශය හරහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ එකඟතාවය හා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි. | නාස්තිය හා අවභාවිතය වැලැක්වීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු මෙහෙයවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘතිය විසින් කොලොන්නාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කල් බදු පදනම මත ලබා ගත් ඉඩමක මුලික වැඩ සැලැස්මේ අඩංගු නොවූ, කාර්යාල ගොඩනැගිල්ලක් රු.මිලියන 162. 41ක පිරිවැයකට ඉදිකර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින දක්වා කල් බදු ගිවිසුමකට එළඹීමකින් තොරව කල්බදු කුලී ලෙස එකතුව රු.මිලියන 5.17 ක් ගෙවා තිබුණි. තවද, 2009 වර්ෂයේ කොළඹ මහා නගර සභාවෙන් කල් බදු පදනම මත ලබා ගන්නා ලද මාළිගාකන්දේ ඉඩමක ව්‍යාපෘතිය විසින් මුලික වැඩ සැලැස්මේ නොමැති තවත් කාර්යාල ගොඩනැගිල්ලක් රු.මිලියන 18ක පිරිවැයකට කල් බදු ගිවිසිමකට එළඹීමකින් තොරව ඉදි කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයේදී බිම් කුලිය ලෙස රු.මිලියන 151.50ක් ගෙවා තිබුණි.අදාල ගොඩනැගිල්ල වර්ෂයේ 2015 සිට කොළඹ මහ නගර සභාවේ කාර්ය මණ්ඩලය ද ප්‍රයෝජනයට ගැනීමට ඉඩ දී තිබූ බව නිරීක්ෂණය විය | නිෂ්ප්‍රයෝජන වියදමක් විය. | එකඟ වේ. ව්‍යාපෘතිය විසින් කල් බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවසන් ගෙවීම ගෙවන ලදි. කොලොන්නාව කාර්යාල ගොඩනැලිල් ඉදිකිරීම මුලික වැඩ සැලැස්මේ නොමැති වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ණය නියෝජිතායනයේ එකඟතාව ලබා ගැනීමට පසුව ක්‍රියා කරන ලදි. | ණයට ගන්නා ලද අරමුදල් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම සඳහා අරම්භක අදියරදීම අවශ්‍යතාවයන් හඳුනා ගත යුතුය. |

## 3.4 පෙර ව්‍යාපෘති වාර්තා මගින් පෙන්වා දුන් නොවිසිඳුනු ගැටළු

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මාර්ග පුනස්ථාපනය සඳහා 2013 වර්ෂයේදී පලාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ වටිනාකම රු. මිලියන 11.9 ක් වූ ආපසු ගෙවීමේ තැන්පතුවල වලංගු කාලය අවසන් වී තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් කර ගෙන නොතිබුණි. | අරමුදල් අනිසි කළමනාකරණයකි. | මාර්ග පුනස්ථාපන කාර්ය සඳහා 2013 වර්ෂයේදී පලාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ රු.මිලියන 11.9 අය කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාජවහන මණ්ඩලය කටයුතු කරමින් පවතී. මුල් තැන්පතුව අස්ථානගත වීම මත අය කර ගැනීම ප්‍රමාද වී ඇත. | අය කර ගැනීම් සඳහා කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

**3.5 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| 1978 දෙසැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 842 හි අවශ්‍යතාවයන්ට අනුව, ව්‍යාපෘතිය විසින් යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | වත්කම් අවභාවිතයට හා ව්‍යාපෘතිය අවසානයේ වත්කම් භාරදීමේදී දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වීය හැක. | 2014 වර්ෂය දක්වා ව්‍යාපෘතිය ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම සහ සත්‍යාපනය කිරීම කර ගෙන යන ලදී. ඉන් පසුව කාලීනව රෙජිස්ටරය යාවත්කාලීන කිරීම් ප්‍රමාදවිය. වර්තමානයේ තිබූ සියලු වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහනය මණ්ඩලයේ විවිධ ශාඛාවන්ට භාර දෙන ලදි. | ව්‍යාපෘතිය මිලදී ගත් වත්කම් හඳුනා ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීන කළ යුතුය. |